# Capture THIS!

## ශ්‍රී ලංකා ඡායාරූප සංගමයේ මාසික ඡායාරූප තරඟය

Capture this!, තරඟකාරී වාතාවරණයක් තුළ ඡායාරූප කුසලතා වර්ධනය කිරීමට අවස්ථාවක් ලබාදීම සඳහා ශ්‍රී ලංකා ඡායාරූප සංගමය විසින් පවත්වනු ලබන මාසික ඡායාරූප තරඟයක් වන අතර වසර අවසානයේදී ත්‍යාග සහ සම්මාන ප්‍රදානය කරනු ලැබේ.

මෙම මාසික තරගය කාණ්ඩ පහක් (5) යටතේ පවත්වනු ලැබේ.

1. තේමාත්මක පැවරුම
2. විවෘත වර්ණ
3. විවෘත ඒකවර්ණ
4. වනජීවී සහ සොබාදහම
5. සංචාරක

### තේමාත්මක පැවරුම

තේමාත්මක පැවරුම් කාණ්ඩයට සහභාගිවන්නන් විසින් එම මාසය සඳහා ලබා දී ඇති තේමාවකට හෝ මාතෘකාවකට ගැලපෙන පරිදි ඡායාරූප ඉදිරිපත් කළ යුතුය. මෙම මාසික මාතෘකා සහ තේමාවන් භාවිතාකර නව ඡායාරූප ගැනීමට සහභාගිවන්නන් දිරිමත් කරන අතර, මින් පෙර ඔවුන් විසින් ගනු ලැබූ, මාතෘකාවට සහ තේමාවට අදාළ ඡායාරූප ඉදිරිපත් කිරීමටද හැකියාව ඇත. තරඟය සඳහා තේමාත්මක පැවරුම් කාණ්ඩය සඳහා ඇතුල්වන්නන්ට වර්ණ හෝ ඒකවර්ණ ඡායාරූප ඉදිරිපත් කළ හැකිය.

මාසික තේමාත්මක පැවරුම් කාණ්ඩය සඳහා මාතෘකා හෝ තේමාවන් වරින් වර සහ කල්තියා ප්‍රකාශයට පත් කෙරේ. අපේක්ෂාවන්, අර්ථ නිරූපණයන් සහ සීමාවන් පිළිබඳ කෙටි පැහැදිලි කිරීමේ සටහනක්ද ලබා දෙනු ඇත.

### තරඟය පවත්වන කාල සීමාව

2022 තරඟ වාරයේ මාසික තරඟ 2022 ජනවාරි සිට 2022 දෙසැම්බර් දක්වා පැවැත්වේ.

### තරඟයට සහභාගී විය හැක්කේ කාටද?

Capture this! 2022 තරඟ වාරය ශ්‍රී ලංකාවේ පදිංචිකරුවන් වන හෝ විදේශයන්හි වෙසෙන සියළුම ශ්‍රී ලාංකික ආධුනික හා වෘත්තික ඡායාරූප ශිල්පීන් සඳහා විවෘතවේ.

# Capture THIS!

## ශ්‍රී ලංකා ඡායාරූප සංගමයේ මාසික ඡායාරූප තරඟය

### ප්‍රවේශ ගාස්තු

ශ්‍රී ලංකා ඡායාරූප සංගමයේ එම අදාළ වර්ෂයට සාමාජික ගාස්තු ගෙවා ඇති සියළුම සාමාජිකයින් ප්‍රවේශ ගාස්තුවකින් තොරව තරඟයට සහභාගී වීමට සුදුසුකම් ලබයි. අවුරුදු 18 ට වැඩි සාමාජිකයෙකු නොවන අයෙකුට ප්‍රවේශ ගාස්තුව වර්ෂයකට රු. 2000 / - ක් වන අතර අවුරුදු 18 ට අඩු සාමාජිකයෙකු නොවන අය සඳහා සහභාගී වීමේ ගාස්තුව රු. 1000 / - කි. සංගමයේ සාමාජිකයින් නොවන අය ප්‍රවේශ ගාස්තුව ගෙවා තරඟය සඳහා ලියාපදිංචි විය යුතුය.

### තරඟය විනිශ්චය කිරීම

අංශ පහේම මාසික ඉදිරිපත් කිරීම් ශ්‍රී ලංකා ඡායාරූප සංගමයේ විධායක කමිටුව විසින් පත් කරන ලද මණ්ඩලයක් විසින් විවෘත විනිශ්චය සැසියකදී මාසිකව විනිශ්චය කරනු ලැබේ.

විනිශ්චය මණ්ඩලය විසින්, ඉදිරිපත් කර ඇති ඡායාරූප (වර්තමාන තරඟ නීති සහ මාර්ගෝපදේශ වලට අනුකූලව) මාතෘකාවට / තේමාවට හෝ අදාළ අංශයේ අවශ්‍යතා සම්පූර්ණ කර තිබීම, එහි තාක්ෂණික නිරවද්‍යතාවය, ඡායාරූපමය වටිනාකම සහ කලාත්මක ප්‍රකාශනය යන කරුණු මත විනිශ්චය මණ්ඩලය විසින් ඇගයීම් කරනු ලැබේ. ඉදිරිපත් කර ඇති ඡායාරූප, විනිශ්චය මණ්ඩලයේ එක් එක් විනිසුරුවරයා විසින් 1 සිට 5 දක්වා ලකුණු ලබා දෙනු ලැබේ. විනිශ්චය මණ්ඩලය විසින් ඡායාරූපයකට ලබාදෙනු ලබන උපරිම ලකුණු ප්‍රමාණය 15 කි.

ශ්‍රී ලංකා ඡායාරූප සංගමයේ වාර්ෂික ජාත්‍යන්තර ඡායාරූප ප්‍රදර්ශනයේ සමාරම්භක උත්සවයේදී පිරිනමන වාර්ෂික සම්මාන සඳහා සෑම තරඟකරුවකුම මාසිකව ලබාගන්නා ලකුණු එකතුකරනු ලැබේ.

සෑම විවෘත විනිශ්චය සැසිවාරයක්ම විනිසුරු සංචිතයකින් තෝරාගනු ලබන විනිශ්චයකරුවන් තිදෙනෙකු විසින් මෙහෙයවනු ලැබේ.

### ජයග්‍රාහකයින්ට ලැබෙන්නේ කුමක්ද?

- විවෘත විනිශ්චයයේදී ලකුණු 15 ක් ලබා ගන්නා සෑම ඡායාරූපයක් සඳහාම රු. 1000 / - ක ත්‍යාගයක් තරඟ වාරය අවසානයේදී ගෙවනු ලැබේ.
- තරඟය පවත්වන කාල සීමාව අවසානයේ එක් එක් අංශයෙන් ඉහළම ලකුණු ලබා ගත් සහභාගිවන්නන් තුන් දෙනාහට වාර්ෂික උත්සවයේදී රන්, රිදී සහ ලෝකඩ පදක්කම් ලැබෙනු ඇත. කෙසේ වෙතත්, පදක්කමක් ලබා ගැනීම සඳහා සහභාගිවන්නෙකු පහත සඳහන් පරිදි අවම ප්‍රතිශතය ලබා ගත යුතුය.

  රන් පදක්කම - තරඟ වාරය සඳහා මුළු ලකුණු වලින් 75% හෝ ඊට වැඩි
  රිදී පදක්කම - තරඟ වාරය සඳහා මුළු ලකුණු වලින් 65% - 74%
  ලෝකඩ පදක්කම - තරඟ වාරය සඳහා මුළු ලකුණු වලින් 50% - 64%
  සෑම කාණ්ඩයකම රන් පදක්කම්ලාභියාට රු. 25,000 / - ක ත්‍යාගයක් ලබාදෙනු ලැබේ.
- සෑම කාණ්ඩයකින්ම ජයග්‍රාහී කණ්ඩායමට සහතික සහ කුසලානයක් ප්‍රදානය කෙරේ.

තරඟයට සහභාගිවන්නන් පිළිපැදිය යුතු නීති සහ මාර්ගෝපදේශ පහත දැක්වේ.

# Capture THIS!

## ශ්‍රී ලංකා ඡායාරූප සංගමයේ මාසික ඡායාරූප තරඟය

## නීති සහ මාර්ගෝපදේශ

1. ඉදිරිපත්කිරීම්, ඡායාරූප ලෙස (ආලෝක සංවේදීතාවයෙන් ඡායාරූප ග්‍රහණය කර ගැනීම) ඡායාරූප සේයාපටල මත හෝ ඩිජිටල් ලෙස ලබා ගත යුතුය. ඡායාරූප ඩිජිටල් ලෙස හෝ වෙනත් ආකාරයකින් කතුවරයා විසින් වෙනස් කළ හැකි අතර ඡායාරූපයේ අන්තර්ගතය ප්‍රමුඛ වන පරිදි වෙනත් ඡායාරූප / කොටස්, කලා කෘති හෝ පරිගණකයෙන් ජනනය කරන ලද ග්‍රැෆික් වැනි අමතර අන්තර්ගතයන් ඇතුළත් කළ හැකිය. පරිගණකයෙන් ජනනය කරන ලද ඡායාරූප පිළිගනු නොලැබේ.

2. සහභාගිවන්නෙකුට සෑම මසකම උපරිම වශයෙන් ඡායාරූප දෙකක් සෑම කාණ්ඩයකටම ඉදිරිපත් කළ හැකිය (හෝ වරින් වර ප්‍රකාශයට පත් කළ හැකි සංඛ්‍යාවක්). එකම ඡායාරූපය (හෝ "කැමරාවේ" හෝ එම ඡායාරූපයේ "ප්‍රතිනිෂ්පාදනය" අනුපිටපතක්) එක් කාණ්ඩයකට වඩා ඉදිරිපත් නොකළ යුතුය.

3. මාසික තරඟය සඳහා මීට පෙර ඉදිරිපත් කරන ලද ලකුණු ප්‍රදානය කරන ලද ඕනෑම ඡායාරූපයක් පසුකාලීන මාසික තරඟවලදී කිසිදු කාණ්ඩයකට නැවත ඉදිරිපත්කිරීමට අවසර නැත. මෙම සීමාව ඡායාරූපයේ ප්‍රමාණය වෙනස්කිරීම, දිශානතිය වෙනස් කිරීම, ඒකවර්ණ බවට පරිවර්තනය කිරීම හා ඒකාබද්ධ කිරීම, ස්ථර කිරීම, වෙනත් ඕනෑම ඡායාරූපයක් / ඡායාරූප සමඟ අධිප්‍රමාණය කිරීම ඇතුළු සියළු වෙනස් කිරීම් වලට අදාළ වේ. එකම ඡායාරූපයක් සහ එකම ඡායාරූපයේ කණ්ඩයක් එකම මාසයේ ඉදිරිපත් කළ විට සලකා බලනු ලබන්නේ එක් ඡායාරූපයක් පමණි.

4. තෝරා නොගත් / ලකුණු ප්‍රධානය නොකරන ලද ඡායාරූප ඉදිරි මාසික තරඟ සඳහා වැඩි දියුණු කිරීම් හෝ වෙනස් කිරීම් සහිතව හෝ රහිතව ඉදිරිපත් කළ හැකිය.

5. ශ්‍රී ලංකා ඡායාරූප සංගමයේ කිසියම් ප්‍රදර්ශනයක, ප්‍රදර්ශනය සඳහා තෝරාගෙන ඇති හෝ සහතික / සම්මාන දිනාගත් ඕනෑම ඡායාරූපයක් පිළිගනු නොලැබේ. ඒ හා සමානව, මාසික තරඟයට ඉදිරිපත් කිරීම සඳහා නියමිත දිනට පෙර වෙනත් දේශීය හෝ ජාත්‍යන්තර ප්‍රදර්ශනයක ප්‍රදර්ශනය සඳහා පිළිගෙන ඇති ඕනෑම ඡායාරූපයක් Capture this! මාසික තරඟය සඳහා ඉදිරිපත් නොකළ යුතුය.

6. මාසික තරඟයකදී ලකුණු ප්‍රදානය කල හෝ නොකල ඡායාරූපයක් ශ්‍රීලංකා ඡායාරූප සංගමයේ ප්‍රදර්ශනයකට හෝ තරඟයකට නැවත ඉදිරිපත් කල හැකිවේ.

7. ඡායාරූපයේ මුහුණතෙහි කිසිදු ආකාරයකින් මාතෘකාවක් හෝ ප්‍රකාශන හිමිකම් තොරතුරු හෝ කතුවරයා හඳුනා ගැනීමට කුමන හෝ සලකුණක් තැබීමට අවසර නැත. එවැනි තොරතුරු ඇතුළත් කිරීමෙන් එම ඡායාරූපය ස්වයංක්‍රීයව තරඟයෙන් ඉවත්වේ.

8. ඡායාරූපයේ ප්‍රමාණය / ගුණාත්මකභාවය / විභේදනය (resolution) සහ ඡායාරූප සඳහා වෙනත් අදාළ විශේෂිත කරුණු සහ ඉදිරිපත් කිරීමේ ක්‍රමය වරින් වර සංගමය විසින් නියම කරනු ලබන අතර සහභාගිවන්නන්ට එය සන්නිවේදනය කරනු ලැබේ. අදාළ මාසික තරඟයේ දී වෙනස් කරනු ලැබූ නිර්ණායකයන්ට අනුව ඉදිරිපත් කරන ලද ඡායාරූප පමණක් පිළිගනු ලැබේ.

9. ඡායාරූපක් ඉදිරිපත් කිරීම මගින්, එම තරඟකරු එය තමාගේම ඡයාරූපයක් බවත්, එය පවත්නා නීතිරීති හා මාර්ගෝපදේශයන්ට අනුකූල බවත් සහතික කරයි. කිසියම් තෙවන පාර්ශවයක් විසින් කිසියම් ප්‍රකාශන හිමිකම් උල්ලංඝනයක්ද / හිමිකම් පෑමක්ද සිදුකළහොත් එම ඡායාරූප ඉදිරිපත්කරන්නා විසින් වගකීම භාර ගත යුතු අතර, එම තැනැත්තා විසින් ප්‍රකාශන හිමිකම හෝ

පුද්ගලික හිමිකම් අනිසි ලෙස භාවිතා කිරීම සම්බන්ධයෙන් කිසිදු වගකීමක් ශ්‍රී ලංකා ඡායාරූප සංගමය විසින් භාර නොගනී.

10. ඡායාරූප ඉදිරිපත් කිරීමෙන් සහභාගිවන්නන්, මාසික තරඟය ප්‍රවර්ධනය කිරීම සඳහා හෝ ශ්‍රී ලංකා ඡායාරූප සංගමය පොදුවේ එහි ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය කිරීමට, එම ඡායාරූප හෝ කොටසක් නොමිලේ ප්‍රතිනිෂ්පාදනය කර ප්‍රදර්ශනය හෝ ප්‍රකාශයට පත් කිරීමට ශ්‍රී ලංකා ඡායාරූප සංගමයට / එහි අනුග්‍රාහකයන්ට අවසර දෙනු ඇත. එවැනි ප්‍රකාශන, මාසික ඩිජිටල් හෝ මුද්‍රිත ප්‍රකාශනයන් ලෙස හෝ , ශ්‍රී ලංකා ඡායාරූප සංගමයේ වෙබ් අඩවියේ, ප්‍රවර්ධන ද්‍රව්‍ය හෝ නාමාවලිවල විය හැකිය.

11. ශ්‍රී ලංකා ඡායාරූප සංගමය, එහි සාමාජිකත්වයෙන් හෝ බාහිරව තෝරාගත් විනිසුරු මඩුල්ලක් ඉදිරිපත් කළ ඡායාරූප ඇගයීම සඳහා නම් කරනු ඇත. විනිශ්චයකරුවන් විසින්, ඔවුන් වෙත නිකුත් කර ඇති නිශ්චිත මාර්ගෝපදේශයන්ට අනුව විනිශ්චය කරනු ලබන අතර, ඇතුල්වීමේ කොන්දේසි ද ඔවුන්ට දැනුම් දෙනු ලැබේ.

12. එසේ පත් කරන ලද විනිසුරු කමිටුව ඔවුන්ගේ අභිමතය පරිදි එම මාසය සඳහා ජයග්‍රාහී ප්‍රවේශයන් තෝරා ගැනීමට තීරණය කළ හැකි අතර කිසියම් අංශයක් සඳහා ඉදිරිපත් කිරීම්, අපේක්ෂාවන්ට වඩා අඩු වුවහොත් ඔවුන්ගේ අභිමතය පරිදි ලකුණු ලබා නොදීමට තීරණය කල හැක.

13. විනිශ්චය මණ්ඩලය විසින් ගනු ලබන තීරණ ඡායාරූප විනිශ්චය කිරීම සම්බන්ධයෙන් අවසාන තීරණය වශයෙන් සලකනු ලැබේ.

14. මෙහි දක්වා ඇති නීති රීති හා මාර්ගෝපදේශයන්ට අනුකූල නොවන ඉදිරිපත් කරන ලද ඕනෑම ඡායාරූපයක් නුසුදුසු ලෙස විනිශ්චය මණ්ඩලය විසින් තීරණය කිරීම හෝ මාසික විනිශ්චයට ප්‍රථම හෝ පසුව ශ්‍රී ලංකා ඡායාරූප සංගමයේ විධායක කමිටුව හෝ ඔවුන් විසින් පත් කරන ලද නිලධාරියෙකු විසින් කල හැකිය. මෙහිදී ශ්‍රී ලංකා ඡායාරූප සංගමය විධායක කමිටුවේ තීරණය අවසාන තීරණය වේ.

15. වරින් වර ශ්‍රී ලංකා ඡායාරූප සංගමය විසින් මෙම නීති රීති සහ මාර්ගෝපදේශ සමාලෝචනය කර සංශෝධනය / වෙනස් කිරීම සිදු කළ හැකිය. එවැනි අවස්ථාවක දී ශ්‍රී ලංකා ඡායාරූප සංගමය විධායක කමිටුව විසින් නීති රීති හා මාර්ගෝපදේශ සංශෝධනය කර එවැනි සංශෝධිත කොන්දේසි සුදුසු ආකාරයෙන් සහභාගිවන්නන්හට දැනුම්දෙනු ලැබේ.

16. කිසියම් වෙනස්කමක් / වෙනස් කිරීම් / සංශෝධන සන්නිවේදනය කරන තෙක් මෙම නීති රීති බලාත්මක වේ.

17. මෙම තරඟයට සහභාගී වීමට අපේක්ෂා කරන වර්තමාන සහ අනාගත සියළුම සහභාගිවන්නන් මෙම මාර්ගෝපදේශ පිළිබඳව දැනුවත්ව හා අනුකූලව කටයුතු කිරීම සහ සාධාරණ හා වගකීමෙන් යුතුව වාර්ෂික සම්මාන සඳහා තරඟ කිරීම ශ්‍රී ලංකා ඡායාරූප සංගමය අපේක්ෂා කරනු ලබයි.

# Capture THIS!

## ශ්‍රී ලංකා ඡායාරූප සංගමයේ මාසික ඡායාරූප තරඟය

**<u>අර්ථ දැක්වීම- ඒකවර්ණ</u>**

ඉතා තද අළු (කළු) සිට ඉතා පැහැදිලි අළු (සුදු) දක්වා කළු හා සුදු කෘතියක් විවිධ අළු පැහැයෙන් වර්ණ පරාසයක් ඇති ඒකවර්ණ කෘතියකි.

මුළුමනින්ම තනි වර්ණයකින් වර්ණ ගැන්වූ කළු සහ සුදු කෘතියක්, කළු හා සුදු කාණ්ඩයට අයත් විය හැකි ඒකවර්ණ කෘතියක් වනු ඇත; FIAP අනුග්‍රහය යටතේ පවත්නා තරඟයකදී නාමාවලියෙහි එවැනි කෘතියක් කළු සහ සුදු වර්ණයෙන් ප්‍රතිනිෂ්පාදනය කළ හැකිය.

අනෙක් අතට කළු හා සුදු කෘතියක් අර්ධ තානයකින් (partial toninng) වෙනස් කිරීම හෝ එක් වර්ණයක් එකතු කිරීම මගින් වර්ණ ගණයට අයත් වන පරිදි වර්ණ කාර්යයක් (බහු වර්ණ) බවට පත්වේ; එවැනි කාර්යයක් සඳහා FIAP අනුග්‍රහය යටතේ පවත්නා තරඟයකදී නාමාවලියෙහි වර්ණ ප්‍රතිනිෂ්පාදනය අවශ්‍ය වේ

**<u>අර්ථ දැක්වීම - සොබාදහම</u>**

සොබාදහමේ බොහෝ අංශ නිරූපණය කිරීම; ශාක හා සත්ව ජීවිතය, ගොඩබිම සහ මුහුදේ ස්වාභාවික ලක්ෂණ හෝ ස්වාභාවික සංසිද්ධි.

සොබාදහමේ ඡායාරූපකරණය ස්වාභාවික ඉතිහාසයේ සියළුම ශාඛා නිරූපණය කිරීම සඳහා ඡායාරූප ක්‍රියාවලියට පමණක් සීමා වී ඇති අතර (මානව විද්‍යාව සහ පුරාවිද්‍යාව හැර) එමඟින් හොඳ දැනුමක් ඇති පුද්ගලයෙකුට විෂය කරුණු හඳුනාගෙන එහි ඉදිරිපත් කිරීම සහතික කළ හැකි විය යුතුය.

**<u>අර්ථ දැක්වීම - වනජීවී</u>**

සොබාදහමේ ඡායාරූපකරණය නිර්වචනය තවදුරටත් අර්ථ දක්වා ඇත්තේ ස්වාභාවික හෝ මිනිසා විසින් නිර්මාණය කල වාසස්ථානයක (adopted habitat) නිදහස් හා බාධාවකින් තොරව පවතින සත්ව විද්‍යා හෝ උද්භිද ජීවීන් එකක් හෝ වැඩි ගණනක් ලෙස ය.

භූ දර්ශන, භූ විද්‍යාත්මක සැකැස්ම, සත්වෝද්‍යානයේ හෝ ක්‍රීඩා ගොවිපල සතුන්ගේ ඡායාරූප හෝ පාලිත තත්වයන් යටතේ ගනු ලබන දැනට පවතින සත්ව විද්‍යාත්මක හෝ උද්භිද විද්‍යාත්මක විශේෂයන් වනජීවී අංශවලට සුදුසුකම් නොලබයි. සමුද්‍රීය විශේෂයන් සහ උද්භිද විද්‍යාත්මක විශේෂයන් (දිලීර හා ඇල්ගී ඇතුළුව) වනජීවී අර්ථ දැක්වීමට ඇතුලත්වේ.

ඡායාරූපයේ ප්‍රමාණය වෙනස් කිරීම (cropping) හැරුණු විට රූපමය අංග එකතු කිරීම, නැවත ස්ථානගත කිරීම, ප්‍රතිස්ථාපනය කිරීම හෝ ඉවත් කිරීම සඳහා අවසර නැත. සොබාදහමේ කතාව හෝ රූපමය අන්තර්ගතය වෙනස් නොකර හෝ මුල් දර්ශනයේ අන්තර්ගතය වෙනස් නොකර ඡායාරූප ඉදිරිපත් කිරීම හා වැඩි දියුණු කරන ශිල්පීය ක්‍රමවලට HDR, focus stacking and dodging/burning ඇතුළුව අවසර ඇත. කැමරාවෙන් එකතු කරන ලද දූවිලි ලප, ඩිජිටල් ශබ්දය සහ සීරීම් වැනි අංග ඉවත් කරන තාක්ෂණයන්ට අවසර ඇත. එකට එකතු කර බැඳී ඡායාරූපවලට අවසර නැත. අවසර දී ඇති සියලුම ගැලපීම් ස්වාභාවික ලෙස පෙනිය යුතුය. වර්ණ රූප අළු පරිමාණ ඒකවර්ණ බවට පරිවර්තනය කළ හැකිය. අධෝරක්ත රූප සඳහා අවසර නැත.

අර්ථ දැක්වීම - සංචාරය

සංචාර ඡායාරූපයක් කාලය හා ස්ථානය පිළිබඳ හැඟීම ප්‍රකාශ කළ යුතු අතර, භූමියක්, එහි සුවිශේෂී ලක්ෂණ හෝ සංස්කෘතිය එහි ස්වාභාවික තත්වයෙන් නිරූපණය කළ යුතුය. භූගෝලීය සීමාවන් නොමැත. පුද්ගලයින්ගේ හෝ වස්තූන්ගේ සමීප පින්තූරවල සුවිශේෂී පරිසරය ඇතුළත් විය යුතුය. ඡායාරූපකරණය සඳහා විශේෂයෙන් සකසා ඇති සිදුවීම් හෝ ක්‍රියාකාරකම්වල ඡායාරූප, හෝ ඡායාරූපකරණය සඳහාම කුලියට ගත් නිරූපණය කරන්නන් ඇතුළත් කල ඡායාරූප සඳහා අවසර නැත. ඡායාරූපයේ ප්‍රමාණය වෙනස් කිරීම (cropping) හැර මුල් රූපයේ ඕනෑම අංගයක් එකතු කිරීම, නැවත ස්ථානගත කිරීම, ප්‍රතිස්ථාපනය කිරීම හෝ ඉවත් කිරීම වැනි ක්‍රමවේදයන්ට අවසර නැත. දූවිලි හෝ ඩිජිටල් ශබ්දය ඉවත් කිරීම, මුල් දර්ශනයේ පෙනුම යථා තත්වයට පත් කිරීම සහ ඒකවර්ණ බවට පූර්ණ පරිවර්තනය කිරීමට අවසර ඇත.. අධෝරක්ත ඇතුළු වෙනත් ව්‍යුත්පන්නයට අවසර නැත. සියලුම රූප ස්වාභාවික විය යුතුය.

## ඡායාරූප ඉදිරිපත් කිරීමේදී සැලකිය යුතු කරුණු

1. ඉදිරිපත්කිරීම් භාරගනු ලබන්නේ ඩිජිටල් ආකෘතියෙන් පමණක් වන අතර ඉදිරිපත්කිරීම් කළ හැක්කේ නම් කරන ලද විද්‍යුත් තැපැල් ලිපිනයට විද්‍යුත් තැපෑලෙන් පමණි.

2. එක් සාමාජිකයෙකුට උපරිම ඡායාරූප 10 ක් ඉදිරිපත් කළ හැකි අතර එක් කාණ්ඩයකට ඉදිරිපත්කල හැකි උපරිම ඡායාරූප සංඛ්‍යාව දෙකක් පමණි.

3. ඡායාරූපයේ දිග පැත්තෙහි (උස හෝ පළල) උපරිම පික්සල් 1920 ක් විය යුතු අතර එය .jpeg ලෙස සහ 2 MB නොඉක්මවන විභේදනයකට (resolution) සුරැකිය යුතුයි.

4. සෑම ඡායාරූපයක්ම එහි මාතෘකාව හෝ නිශ්චිත නම භාවිතයෙන් සුරැකිය යුතු අතර ඉදිරිපත් කිරීමේ කාණ්ඩය / කාණ්ඩය නිවැරදිව හඳුනා ගැනීම සඳහා පහත පරිදි ලේබල් කළ යුතුය:

| | |
|---|---|
| තේමාත්මක පැවරුම | AS _ (ඡායාරූප අංකය _ මාතෘකාව) |
| විවෘත වර්ණය | OC_ (ඡායාරූප අංකය _ මාතෘකාව) |
| ඒකවර්ණ | OM_ (ඡායාරූප අංකය _ මාතෘකාව) |
| වනජීවී සහ සොබාදහම | WN_ (ඡායාරූප අංකය_ මාතෘකාව) |
| සංචාරය | TR_ (ඡායාරූප අංකය_ මාතෘකාව) |

(පැවරුම් ඉදිරිපත් කිරීම සඳහා උදාහරණයක් AS_01_Serene)

5. සියළුම ඉදිරිපත් කිරීම් මාසය සඳහා නම් කරන ලද දිනය හා වේලාවට capturethispssl@gmail.com වෙත විද්‍යුත් තැපෑලෙන් එවිය යුතුය. කප්පාදුව (නිදසුනක් ලෙස ජූනි 30, ඉරිදා මධ්‍යම රාත්‍රී 12 ට) ඇතුල් කරන්නාගේ පරිගණකයෙන් සම්ප්‍රේෂණය වන අවස්ථාවේදී ඉදිරිපත් කිරීමේදී සටහන් වන වේලාව වේ. ජනවාරි 2021 සඳහා සෑම කාණ්ඩයක් සඳහාම ඡායාරූප භාර ගැනීම දෙසැම්බර් 31, 2020 දින පැය.24:00 ට අවසන්වේ.

6. විද්‍යුත් තැපෑලෙහි විෂය රේඛාව පහත පරිදි තබා ගැනීමට කරුණාකර සටහන් කරන්න: සහභාගිවන්නාගේ නම + ඉදිරිපත් කළ මාසය + මුළු ඡායාරූප ගණන ( උ.දා. Sampath Perera+April+8 images)

7. සහභාගිවන්නෙකුට එක් මසකට එක් විද්‍යුත් තැපෑලක් පමණක් පිළිගනු ලැබේ. එකම මාසයක් සඳහා ඕනෑම ඊමේල් එකක් ඕනෑම සහභාගිවන්නෙකු විසින් ඉදිරිපත් කරනු ලැබුවහොත්, ශ්‍රී ලංකා ඡායාරූප සංගමය වෙත ලැබෙන පළමු විද්‍යුත් තැපැල පමණක් එම මාසය සඳහා පිළිගනු ලැබේ.

8. මෙහි දක්වා ඇති ඉදිරිපත් කිරීමේ අවශ්‍යතාවයන්ට අනුකූල නොවන ප්‍රවේශයන් ස්වයංක්‍රීයව නුසුදුසු වනු ඇත.

# Capture THIS!

## ශ්‍රී ලංකා ඡායාරූප සංගමයේ මාසික ඡායාරූප තරඟය

### ඔබ කළ යුතු දේ

1. මාතෘකාව / තේමාව (සහ ඒ සමඟ ඇති විස්තරය) පරීක්ෂා කර අනුකූල වන්න

2. කාණ්ඩයකට ඡායාරූප දෙකක් පමණක් ඉදිරිපත් කරන්න.

3. ඔබ ලබා දී ඇති උපදෙස් අනුගමනය කර ඡායාරූප නියමිත ලෙස නම් කර, අදාළ ප්‍රමාණයට සකසා විද්‍යුත් තැපැලයෙන් එවන්න.

4. නියමිත දිනට හෝ ඊට පෙර ඉදිරිපත් කරන්න.

5. මසකට එක් විද්‍යුත් තැපෑලක් පමණක් එවිය යුතුය.

6. සවිස්තරාත්මක නීති සහ මාර්ගෝපදේශ පරීක්ෂා කර හුරු වන්න. ඔබට තවත් තොරතුරු අවශ්‍ය නම් අප සමඟ කතා කරන්න.

### නොකළ යුතුදේ

1. කිසියම් කාණ්ඩයක් යටතේ මාසික තරඟයකදී මීට පෙර තෝරාගත් (සහ ලබාගත් ලකුණු) නැවත ඉදිරිපත් කිරීම

2. ශ්‍රීලංකා ඡායාරූප සංගමයේ වාර්ෂික ප්‍රදර්ශනවලදී හෝ වෙනත් දේශීය හෝ විදේශීය ප්‍රදර්ශනයකදී ප්‍රදර්ශනය කරන ලද / දිනාගත් ඡායාරූප ඇතුළත් කිරීම.

3. ඩිජිටල් තාක්ෂනය යොදා සම්පූර්ණයෙන්ම සාදන ලද ඡායාරූප ඉදිරිපත් කිරීම

4. ඡායාරූපයේ මුහුණතෙහි කිසියම් මාතෘකාවක්, ප්‍රකාශන හිමිකම් තොරතුරු හෝ කතෘගේ අනන්‍යතාවයක් තැබීම

5. ඔබට ප්‍රකාශන හිමිකම් නොමැති ඡායාරූප ඉදිරිපත් කිරීම හෝ ඡායාරූපවල කොටස් භාවිතා කිරීම.